# කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) මණ්ඩපය / ලංකාපැක් (Lankapak) ප්‍රදර්ශනය 2026

27TH EDITION
SINCE 1981

ORGANIZED BY
Sri Lanka Institute of Packaging

EVENT ORGANIZER
CDC EVENTS
& Travels (Pvt) Ltd

UNPACK POTENTIAL IN PACKAGING
LANKAPAK 2026

23 24 25
ඔක්තෝබර් 2026

## ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ කර්මාන්ත සඳහා වන විශේෂ මණ්ඩපය (Special SME Pavilion)

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඇසුරුම්කරණ ආයතනය (SLIP) හා එක්ව, ඇසුරුම්කරණ ක්ෂේත්‍රයේ නියැළී සිටින ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට තම නිෂ්පාදන, තාක්ෂණයන් සහ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමටත්, නව වෙළඳපොළ අවස්ථා ගවේෂණය කිරීමටත් අවස්ථාව සැලසීම සඳහා LANKAPAK 2026 ප්‍රදර්ශනයේ විශේෂ SME මණ්ඩපයක් සංවිධානය කරයි.

සුදුසුකම් ලබන ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ඇසුරුම්කරණ කර්මාන්තකරුවන්ට සහනදායී කුටි ගාස්තුවක් යටතේ මෙම විශේෂ SME මණ්ඩපයට සහභාගී වීමට අවස්ථාව හිමිවේ.

**ප්‍රදර්ශකයන්ගේ ක්ෂේත්‍ර (Exhibitor Profile)**

**පහත සඳහන් කාණ්ඩයන්හි නිරත නිෂ්පාදකයින්ගෙන් අමාත්‍යාංශය අයදුම්පත් කැඳවයි :**

- ඇසුරුම් නිෂ්පාදනය (Packaging manufactiuring)
- කඩදාසි සහ කාඩ්බෝඩ් ඇසුරුම් (Paper and paperboard Packaging)
- නම්‍යශීලී ඇසුරුම් (Flexible packaging)
- ප්ලාස්ටික් ඇසුරුම් (Plastic packaging)
- ජෛව හායනයට ලක්විය හැකි ඇසුරුම් නිෂ්පාදන (Bio - degradable packaging products)
- මුද්‍රණ සහ ලේබල් නිෂ්පාදන (Printing and labelling products)
- ඇසුරුම්කරණ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ (Packaging machinery and equipment)
- එක්වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් සඳහා විකල්ප නිෂ්පාදන (Alternative products for single-use plastics)

*තිරසාර සහ පරිසර හිතකාමී ඇසුරුම් නිෂ්පාදන සිදුකරන ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා තේරීමේදී ප්‍රමුඛතාවය හිමිවේ.*

## තෝරාගැනීමේ ක්‍රමවේදය

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන කමිටුවක් මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයක් හරහා අයදුම්පත් ඇගයීමට ලක්කර තෝරාගනු ලැබේ. වඩාත්ම සුදුසු අයදුම්කරුවන් විශේෂ SME මණ්ඩපයට සහභාගීකරවා ගැනීමට තෝරා ගැනෙනු ඇත.

## අයදුම් කරන්නේ කෙසේද ?

2026 ඔක්තෝබර් 12 වන දිනට හෝ ඊට පෙර උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ව්‍යවසායන් QR කේතය (Google සබැඳිය : https://forms.gle/58sUhAiTxtHs2SgcA) හරහා අයදුම්පත් යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**වැඩිදුර තොරතුරු සඳහා :**

**අධ්‍යක්ෂ - සංවර්ධන අංශය 1**
**දුරකථන : 011-2422319**
**විද්‍යුත් තැපැල : sector1@industry.gov.lk**
**වෙබ් අඩවිය : www.industry.gov.lk**

**ලේකම්,**
**කර්මාන්ත හා ව්‍යවසායකත්ව**
**සංවර්ධන අමාත්‍යාංශය,**
**73/1, ගාලු පාර, කොළඹ 03.**